# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1954/9 - 2016 පෙබරවාරි මස 16 වැනි අඟහරුවාදා - 2016.02.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පඩිපාලක සභා ආඥාපනත

### නිවේදනයයි

**පඩි පාලක සභා ලේකම්වරයකු පත්කිරීම**

පඩි පාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 8 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද පහත දක්වෙන කර්මාන්තයන් පිළිබඳ පඩිපාලක සභාවන් සඳහා ලේකම් වූ වල්පිටගේ දෝන බියංකා සඳමාලි වල්පිට මිය වෙනුවට කම්කරු නිලධාරී හංගිලි ගුරුන්නැහැලාගේ වසන්ත ගුණවර්ධන මහතා නැවත නියෝග කරනතුරු පඩිපාලක සභා ලේකම් වශයෙන් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ඇමතිතුමා විසින් පත්කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2016.02.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම පත්වීම ක්‍රියාත්මක කරනු ලැබේ.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

1. තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තය.
2. කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීමේ හා සෑදීමේ කර්මාන්තය.
3. රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය.
4. පොල් වැවීමේ කර්මාන්තය.
5. ඉංජිනේරු කර්මාන්තය.
6. මුද්‍රණ කර්මාන්තය.
7. තේ පිටරට යැවීමේ කර්මාන්තය.
8. රබර් පිටරට යැවීමේ කර්මාන්තය.
9. මත්පැන් හා විනාකිරි කර්මාන්තය.
10. ගිණි පෙට්ටි සෑදීමේ කර්මාන්තය.
11. පොල් නිපදවීමේ කර්මාන්තය.
12. ගොඩනැගිලි කර්මාන්තය.


1A - G 23030 — 08 (2016/02)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

13. බීඩි සෑදීමේ කර්මාන්තය.
14. බේකරි කර්මාන්තය.
15. ගඩොල් සහ උළු නිපදවීමේ කර්මාන්තය.
16. අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා ජෑම් සෑදීමේ කර්මාන්තය.
17. ගුදරි කොහු හා ඇට කෙඳි කොහු පිටරට යැවීමේ කර්මාන්තය.
18. ඇඳුම් සෑදීමේ කර්මාන්තය.
19. හොසියරි (මේස් භාණ්ඩ) සෑදීමේ කර්මාන්තය.
20. වී කෙටීමේ කර්මාන්තය.
21. රෙදි පිළි නිෂ්පාදන කර්මාන්තය.
22. විස්කෝතු හා රසකැවිලි සෑදීමේ (චොක්ලට් සෑදීම ඇතුළුව) කර්මාන්තය.
23. රබර්, ටයර් නිෂ්පාදනය හා නැවත පිරවීම ඇතුළුව ප්ලාස්ටික් හා පෙට්‍රෝලියම් රෙසින ආශ්‍රිත භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය.
24. සම් පදම් කිරීම පාවහන් හා සම් භාණ්ඩ සෑදීමේ කර්මාන්තය.
25. පිඟන් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය.
26. ඉස්සන් බෝ කිරීමේ හා පිටරට යැවීමේ කර්මාන්තය.
27. ගල් කෝරි හා කළුගල් කැඩීමේ කර්මාන්තය.
28. මිනිරන් කර්මාන්තය.
29. කුරුඳු කර්මාන්තය.
30. දුම්කොළ කර්මාන්තය.
31. සුරුට්ටු කර්මාන්තය.
32. මල් විසිතුරු පැල එළවළු හා පළතුරු වගා කිරීමේ හා අපනයනය කිරීමේ කර්මාන්තය.
33. මෝටර් රථ ගමනාගමන කර්මාන්තය.
34. සිනමා කර්මාන්තය.
35. සාත්තු නිවාස කර්මාන්තය.
36. හෝටල් හා භෝජන සැපයීමේ කර්මාන්තය.
37. ආරක්ෂක සේවා කර්මාන්තය.
38. පුවත්පත් කලාවේදී කර්මාන්තය.
39. සිල්ලර හා තොග වෙළඳ කර්මාන්තය.
40. නැව්තටාක තොටුපලවල් හා වරායයන්හී ප්‍රවාහන කර්මාන්තය.
41. පවිත්‍රතා සේවා කර්මාන්තය.
42. බතික් කර්මාන්තය.
43. වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය.
44. පෙර පාසැල් කර්මාන්තය.

03 - 37

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.